# සියලුම සිසුන් සඳහා කෙරෙන විශේෂ දැනුම් දීම

## කැලණිය විශ්වවිද්‍යාලය

**රට තුළ උද්ගත වූ තත්ත්වය සැලකිල්ලට ගෙන කැලණිය විශ්වවිද්‍යාලයේ සහ සිසුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා 2019.05.27 දින සිට පහත සඳහන් ආරක්ෂක පියවර අනුගමනය කිරීමට තීරණය කර ඇති බව දැනුම් දෙන අතර ඒ සඳහා ඔබගේ පූර්ණ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.**

- විශ්වවිද්‍යාලය තුළ රැඳී සිටින කාලයේ දී සිසුන් තම ශිෂ්‍ය හැඳුනුම්පත තමා සන්තකයේ තබා ගත යුතු ය.
- දේශන ශාලාවල හැර සෙසු ස්ථානවල එක් රැස් වී නොසිටීමට වග බලා ගත යුතු ය.
- ආරක්ෂක හේතුන් මත අවශ්‍ය වුවහොත් ඔබගේ ගමන්මලු සහ හැඳුනුම්පත පරීක්ෂා කිරීමට ආරක්ෂක අංශවලට අවස්ථාව සලසා දිය යුතු ය.
- දේශන ශාලා/විද්‍යාගාර/කාර්යාල හා ආපනශාලාවලට හැකිතාක් අත්‍යාවශ්‍ය ලිපි ද්‍රව්‍ය පමණක් රැගෙන යාමට කටයුතු කළ යුතු ය.
- නිරන්තරයෙන් විමසිලිමත් භාවයෙන් සිටිය යුතු අතර, සැක කටයුතු යමක් දුටුවහොත් ඒ පිළිබඳ පළමුව විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නිලධාරින් දැනුවත් කළ යුතු ය.
- විශ්වවිද්‍යාල භූමියට ඇතුල් වීමට ඉඩ ලබා දෙන්නේ අවසරලත් වාහනවලට පමණි. වාහන හා යතුරු පැදි භාවිතා කරන සිසුන් අදාළ පීඨ කාර්යාලයෙන් ඉල්ලුම්පතක් ලබා ගෙන වාහන සඳහා ශිෂ්‍ය සේවා අංශයෙන් අවසර පත්‍රයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.
- අවසර පත්‍රයක් ලබාගෙන ඇති වාහන එම අවසර පත්‍රය වාහනයේ ප්‍රදර්ශනය කළ යුතු අතර එම වාහන ශිෂ්‍ය මධ්‍යස්ථානයේ පමණක් ගාල්කර තැබිය යුතු ය.
- රාත්‍රී 9 න් පසු කිසිදු වාහනයක්/යතුරු පැදියක් විශ්වවිද්‍යාල භූමියේ නවතා තැබීම තහනම් ය.
- රාත්‍රී 9 න් පසු කිසිදු විද්‍යාර්ථියකු විශ්වවිද්‍යාල භූමියේ රැඳී නොසිටිය යුතු ය.
- රාත්‍රී 9 න් පසු සියලුම ආපනශාලා/ශිෂ්‍ය මධ්‍යස්ථානය/ශිෂ්‍ය විවේකාගාර වසා තබන බැවින් එම ස්ථානයන් හි රැඳී නොසිටිය යුතු ය.
- රාත්‍රී 8 ට පෙර නේවාසිකාගාර හිමි සිසුන් තම නේවාසිකාගාරවලට යා යුතු ය.
- කිසිඳු උත්සව අවස්ථාවක්/රැස්වීමක්/ප්‍රදර්ශන කුටියක්/වෙළඳ කුටියක් හෝ මොනයම් හෝ ශිෂ්‍ය ක්‍රියාකාරකමක් නිසි අවසරයකින් තොරව පැවැත්වීමට කටයුතු නොකළ යුතු ය.

නියෝජ්‍ය උපකුලපති

කැලණිය විශ්වවිද්‍යාලය

2019.05.25